# කැලණිය විශ්වවිද්‍යාලය පර්යේෂණ ප්‍රතිපාදන මූල්‍ය කටයුතු කළමනාකරණය සඳහා මාර්ගෝපදේශය

**පර්යේෂණ ප්‍රතිපාදනවල මූල්‍ය කටයුතු කළමනාකරණය අවශ්‍ය වන අවස්ථා.**

1. පර්යේෂණ ප්‍රතිපාදන සඳහා අයවැය සැකසීම සහ පර්යේෂණ ආධාර මුදල තීරණය කිරීම.
2. නිර්දේශිත අයවැය වාර්තාව සංශෝධනය කිරීම.
3. පර්යේෂණ අත්තිකාරම් ලබා ගැනීම සහ ඒවා පියවීම.
4. ඍජු මුදල් ගෙවීම් සහ මිලදී ගැනීම්.
5. අනුමත ක්‍රියාපටිපාටියෙන් වෙන්වීම සඳහා කරන ඉල්ලීම්.
6. අවසන් පර්යේෂණ වාර්තාව සහ මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම.

## 1. <u>අයවැය සැකසීම</u>

1. පර්යේෂකයා විසින් පර්යේෂණ ප්‍රතිපාදන අයදුම්පත්‍රය නිසිපරිදි පිරවිය යුතු අතර එක් එක් කොටස් සඳහා වැයවීම් පර්යේෂකයා විසින් තීරණය කළ යුතුය. එම කොටස්වල එකතුව මුළු පර්යේෂණ ප්‍රතිපාදන මුදල නොඉක්මවිය යුතුය.

2. පර්යේෂකයා විසින් පර්යේෂණ ප්‍රතිපාදන අයදුම්පත්‍රයෙහි අයවැය සඳහන් කර ඇති ආකාරයටම පර්යේෂණ කරගෙන යා යුතු වේ.

3. පර්යේෂණ ප්‍රතිපාදන ලිපිය ලැබී එකඟතා පත්‍ර අත්සන් කිරීමෙන් පසු,වෛද්‍ය පීඨයට අනුයුක්ත පර්යේෂකයින් තම පර්යේෂණ ආධාර මුදල් වෛද්‍ය පීඨය වෙත මාරු කර ගැනීම සඳහා අංශ ප්‍රධාන හා පීඨාධිපති මගින් උපකුලපති වෙත ඉල්ලීම් සිදු කළ යුතුය.

4. පර්යේෂකයා විසින් සිදුකරනු ලබන සියලුම මිලදී ගැනීම් විශ්වවිද්‍යාලය විසින් සපයා ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට යටත්ව සිදුකළ යුතුය .

## 2. <u>අනුමත අයවැය සංශෝධනය කිරීම.</u>

1. පර්යේෂකයා විසින් අනුමත පර්යේෂණ සැලසුම සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන්නේ නම් සහ එය අයවැය හා සම්බන්ධ වේ නම්, පර්යේෂකයා විසින් සංශෝධිත අයවැය වාර්තාවක්, පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතු වේ.

   උදා-: පර්යේෂකයා විසින් රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු.50,000.00 මුදලක් වෙන් කර ඇති නමුත්, රසායන ද්‍රව්‍ය මිලදී ගැනීමට යන අවස්ථාවේදී ඒ සඳහා අපේක්ෂිත මුදලට වඩා වැඩි මුදලක් වැය වේ නම්,ඒ සඳහා පර්යේෂණ ප්‍රතිපාදන අයදුම්පතෙහි ඇති "පාරිභෝගික ද්‍රව්‍ය " යන කොටස අවශ්‍ය පරිදි සකස් කර, එය

පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කළ යුතුය.තවද සංශෝධිත අයවැය සම්පූර්ණ පර්යේෂණ ආධාර මුදල නොඉක්මවිය යුතුය.

Submited proposal

**Annexure V**

| Details of estimated expenditure. | Rs. | Rs. |
|---|---|---|
| (a) Personnel (e.g., Payment for data collectors/technicians) Souvenirs, tokens for appreciation for participants etc. are not considered | 2500 per person × 2 × 12 | Rs. 60,000.00 |
| (b) Cost of capital equipment | IR digital thermometer = 45,000<br>Camera traps = 115,000 | Rs. 160,000.00 |
| (c) Consumables<br>(i). Cost of chemicals and other consumables<br>(ii). Cost of other materials | Dissecting sets<br>10,000/per set × 2 | Rs. 20,000.00 |
| (d) Travelling and subsistence (local travel only) | 13 visits for two persons<br>5,000 per person × 13 × 2 | Rs. 130,000.00 |
| (e) Miscellaneous<br>(i). Incidental expenses<br>(ii). Cost for preparing research report | Purchasing animal guides = 50,000<br>Purchasing stationaries = 10,000<br>Publication cost = 30,000 | Rs. 60,000.00<br>Rs. 30,000.00 |
| Total | | Rs. 460,000.00 |

Edited section is Highlighted.

**Annexure V**

| Details of estimated expenditure. | Rs. | Rs. |
|---|---|---|
| (a) Personnel (e.g., Payment for data collectors/technicians) Souvenirs, tokens for appreciation for participants etc. are not considered | 2500 per person × 2 × 12 | 60,000.00 |
| (b) Cost of capital equipment | IR digital thermometer = 45,000<br>Camera traps = 115,000 | 160,000.00 |
| (c) Consumables<br>(i). Cost of chemicals and other consumables<br>(ii). Cost of other materials | Dissecting sets<br>10,000/per set × 2 | 20,000.00 |
| (d) Travelling and subsistence (local travel only)<br>Vehicle hiring cost (Safari jeep) | 12 visits<br>13,000 per visit× 12 | 156,000.00 |
| (e) Miscellaneous<br>(i). Incidental expenses<br>(ii). Cost for preparing research report | Purchasing animal guides = 34,000<br>Purchasing stationary = 10,000<br>Publication cost = 30,000 | 34,000.00<br>30,000.00 |
| Total | | 460,000.00 |

මුල් අයවැය

සංශෝධනය කළ අයවැය

2. අයවැය සංශෝධනය කර, ඒ අනුව ප්‍රතිපාදනද වියදම් කළ පසුකළ පසු නැවත පෙර ඉදිරිපත් කළ අයවැය වලංගු නොවන බවට පර්යේෂකයා විසින් සිහිතබා ගත යුතුය. උදා-: පළමු අයවැය සංශෝධනයෙහි ප්‍රතිපාදන මුදලින් 80% ක මූලික මිලදී ගැනීම සඳහාත් 20% ක අනෙකුත් වියදම් සඳහාත් වෙන්කර ඇති විට හා 80% ක මූලික මිලදී ගැනීම සිදුකර අවසන් වූ අවස්ථාවක පර්යේෂකයා විසින් නැවත අයවැය සංශෝධනයක් ඉදිරිපත් කරන්නේ නම් එම සංශෝධනය සිදුකළ හැක්කේ අනෙකුත් වියදම් සඳහා වෙන් වූ 20% සඳහා පමණි .

## 3. අත්තිකාරම් මුදල් ලබා ගැනීම සහ පියවීම

1. පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා අදාළ මුදල් ලබා ගැනීමට වවුචර් පතක් ඉදිරිපත් කිරීම සහ ඒවා ලබාගත් පසු පර්යේෂණ ව්‍යාපෘති කාලය අවසන් වීමට ප්‍රථම නිසි ලෙස ඒවා පියවීම පර්යේෂකයාගේ වගකීම වේ.

2. එක් වරකට ලබාගත හැක්කේ පර්යේෂණ ව්‍යාපෘති ආධාර මුදලින් 25% ක් පමණි .

3. යම් හෙයකින් පර්යේෂකයා හට පර්යේෂණ ආධාර මුදලින් 25% ට වඩා එක්වරකට ලබා ගැනීමට අවශ්‍ය නම් පර්යේෂකයා විසින් එය සාධාරණීකරණය කරමින් ලිඛිත ඉල්ලීමක් පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ අනුමැතිය හා නිර්දේශය සඳහා ඉදිරිපත් කළ යුතුය .

4. රු.15000 - 50000 අතර ප්‍රසම්පාදන අරමුදල් සැපයුම් කමිටුව මගින් අනුමත කරවාගත යුතුය. එම ඉල්ලීම පර්යේෂණ හා ප්‍රකාශන අංශය හරහා සැපයුම් අංශය වෙත යැවිය යුතුය.

5. පර්යේෂකයා විසින් ලබා ගන්නා එක් එක් මුදල් අත්තිකාරම් ඊළඟ මුදල් ඉල්ලුම් කිරීමට ප්‍රථම පියවීම කළ යුතුය .

    a. ඉදිරිපත් කරන බිල්පත්වල දින සටහන් විය යුත්තේ මුදල් අතිකාරම් ලබාගත් දිනට පසු සහ එය පියවීම සිදුකරන දිනට පෙරවේ. යම් අවස්ථාවකදී අත්තිකාරම් මුදල් ලබා ගැනීමට ප්‍රථම මිලදී ගැනීම් සිදුකර ඇත්නම් එම මුදල් ප්‍රතිපූරකය සඳහා ඉල්ලීමක් පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

    b. සියලුම බිල්පත් පැහැදිලි විය යුතු අතර ඒවා පර්යේෂකයා විසින් සහතික කර තිබීම අනිවාර්ය වේ.

    c. සියලුම බිල්පත්වල ඡායාපිටපත් ලබාගෙන ඒවා බිල්පත්වල මුල් පිටපත සමඟ අමුණා එවීම අනිවාර්ය වේ.(කල්ගත වීමත් සමඟ දින සටහන් හා අංක මැකී යා හැකි බැවින්)

    d. පර්යේෂකයා විසින් කරනු ලබන වැයවීම් පිලිබඳ සංක්ෂිප්ත සටහනක් අත්තිකාරම් පියවීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

    e. පළමු අත්තිකාරම් මුදල ලබා ගැනීමෙන් පසුව ඉතිරි අත්තිකාරම් මුදල් නිදහස් කරනුයේ පෙර ලබා ගත් මුදල් අත්තිකාරම් පියවීමෙන් පසුව ය.

මුදල් අත්තිකාරම් පියවීම් පිළිබඳ සටහන

<table>
<tr><td colspan="3">1. ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන මුළු මුදල -</td></tr>
<tr><td colspan="3">2. පළමු/පෙර ලබාගත් මුදල් අත්තිකාරම් පියවා ඇතිද? ඔව් ☐ නැත ☐<br><br>පියවා ඇත්නම් මුදල</td></tr>
<tr><td>3.බිල්පත් පිළිබඳ විස්තර<br>(අංකය සහ භාණ්ඩය)</td><td>පර්යේෂණ ප්‍රතිපාදන අයදුම් පතෙහි එය අයත් වන කොටස</td><td>මුදල</td></tr>
<tr><td>උදා 1. සයනයිට් මිලදී ගැනීම</td><td>පාරිභෝගික</td><td>500</td></tr>
<tr><td>2. කුලී රථ</td><td>ප්‍රවාහන</td><td>650</td></tr>
<tr><td>මුළු එකතුව</td><td></td><td>1150</td></tr>
<tr><td colspan="3">කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි</td></tr>
<tr><td>4.බිල්පත් අදාළ කාල පරාසය තුළ පවතී</td><td colspan="2">ඔව් ☐ නැත ☐</td></tr>
<tr><td>5.එක් එක් බිල් පර්යේෂකවරයා විසින් සහතික කර ඇත</td><td colspan="2">ඔව් ☐ නැත ☐</td></tr>
<tr><td>6. එක් එක් බිලෙහි ඡායා පිටපත් අමුණා ඇත</td><td colspan="2">ඔව් ☐ නැත ☐</td></tr>
</table>

මුළු එකතුව ලබාගත් පර්යේෂණ අත්තිකාරම් මුදලට සමාන විය යුතුය

## 4. <u>සෘජු මිලදී ගැනීම් සහ ගෙවීම්</u>

### a. ගෙවීම්

1. සෘජු ගෙවීම් සඳහා වවුචර පත් අංශ ප්‍රධාන,පීඨාධිපතිගේ නිර්දේශ සහිතව පර්යේෂණ හා ප්‍රකාශන අංශය හරහා ගෙවීම් අංශයට වෙනම භාරදිය යුතු අතර අතිකාරම් මුදල් ඉල්ලීම් / පියවීම් සමඟ එක්ව භාරදීම සිදු නොකළ යුතුය .

2. පර්යේෂකයා විසින් කුමන කොටසට අදාළව ගෙවීම් කටයුතු කළ යුතු ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය .

3. ගෙවීම් ලැබිය යුතු පාර්ශවය පිළිබඳව විස්තර ඉන්වොයිසියෙහි පැහැදිලි විය යුතු අතර රිසිට් පතෙහි මුල් පිටපත සමග සෘජු ගෙවීමක් සඳහා යාමට හේතුව පැහැදිලිව සටහන් කර භාරදීම සිදුකළ යුතුය .

**b. මිලදී ගැනීම්**

1. සියලුම මිලදී ගැනීම් සැපයුම් අංශය විසින් ඉදිරිපත් කර ඇති ප්‍රසම්පාදන රීති වලට අනුකූල විය යුතු අතර අංශ ප්‍රධානීන්ගේ හා දෙපාර්තමේන්තු ප්‍රධානී ගේ නිර්දේශ සහිතව පර්යේෂණ හා ප්‍රකාශන අංශය වෙත ඉදිරිපත් කළ යුතුය .

2. මූලධන වියදම් සඳහා පැහැදිලි හා ප්‍රමාණවත් මුදලක් අනුමත අයවැයෙහි සඳහන් විය යුතුය .

3. මූලධන මිලදී ගැනීම් සඳහා පර්යේෂණ ආධාර මුදලින් 80% වඩා අවශ්‍ය වන්නේ නම් පර්යේෂකයා විසින් ඒ සඳහා සාධාරණීකරණය කරන ලද හේතු සහිතව පර්යේෂණ හා ප්‍රකාශන කමිටු අනුමැතියක් ලබාගත යුතුවේ

4. එවැනි අවස්ථාවලදී අනෙකුත් මිලදී ගැනීම් සඳහා යන වියදම් සමබර කරගැනීම පර්යේෂකයා සතුවේ

5. එක්වරක් අයවැය සංශෝධනය කළ පසු හා මූල්‍යමය කටයුතු ආරම්භ කළ පසු නැවත පෙර තිබූ අයවැය හා කටයුතු කිරීමට පර්යේෂකයාට අවස්ථාවක් නොමැත .
   ඉහත 2.2 පරිශීලනය කරන්න

## 5 <u>අනුමත ක්‍රියා පටිපාටියෙන් වෙන්වීම සඳහා කරනු ලබන ඉල්ලීම්</u>

1. පර්යේෂණ කටයුතු අනුමත කාලයේ දී අවසන් කිරීමට නොහැකි වන්නේ නම් පරීක්ෂකයා විසින් පර්යේෂණ කාලය දිගු කර ගැනීමක් සිදුකළ යුතුය එම කාලය තුළ පර්යේෂණ ආධාර මුදල් භාවිතා කිරීමද කළ යුතුය .

2. යම් හෙයකින් අනුමත කාලය තුළ පර්යේෂකයා හට පර්යේෂණ කටයුතු අවසන් කර ගැනීමට නොහැකි නම් පර්යේෂකයා විසින් පර්යේෂණයේ වත්මන් තත්ත්වය පැහැදිලි කරමින් සහ පර්යේෂණය ඉදිරියට කරගෙන යාමට නොහැකි වන හේතුව පැහැදිලිව සඳහන් කර විස්තරාත්මක වාර්තාවක් අයවැය වාර්තාවක් සමග ඉදිරිපත් කළ යුතුය.

3. පර්යේෂණය සම්පූර්ණයෙන් අවසන් නොකළද පර්යේෂණය සඳහා ලබාගත් මුදල් අතිකාරම් පියවීම පිළිබඳ වගකීම පර්යේෂකයා සතුවේ

4. පර්යේෂණ කටයුතු සඳහා පර්යේෂකයාගේ පෞද්ගලික මුදල් පරිහරණය කර නැවත අයකර ගැනීම දිරිමත් නොකරයි .එහෙත් පර්යේෂකයා හට පළමු මුදල් අත්තිකාරම ලබා ගැනීමට අවම මාසයකට පෙර අත්‍යවශ්‍ය හේතුවක් මත ගෙවීම් කටයුතු සිදුකිරීමට වන්නේ නම් එවැනි අවස්ථාවක මුදල් ප්‍රතිපූරකය සඳහා ඉල්ලීමක් සාධාරණීය හේතු සහිතව පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය

5. යම් හෙයකින් පර්යේෂකවරයාට පර්යේෂණ කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකි වන්නේ නම් විදෙස් ගතවීමක්, සේවයෙන් ඉවත් වීමක් වැනි අවස්ථාවලදී පර්යේෂණ කටයුතු ඉදිරියට කරගෙන යාමට වෙනත් පර්යේෂකයෙක් නිර්දේශ කිරීම හෝ පර්යේෂණය ස්ථිර වශයෙන්ම අවලංගු කිරීම පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ අනුමැතිය මත සිදුකළ යුතුය.

6. එවැනි අවස්ථාවලදී පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුවේ
    a. පර්යේෂකවරයා විසින් විධිමත් ලෙස වෙනත් පර්යේෂකවරයෙකු නිර්දේශ කර එය අංශ ප්‍රධානී හා පීඨාධිපති මගින් පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය .
    b. ගිවිසුම් පත්‍රය අලුතින් පත් කරන ලද පරීක්ෂකයාගේ නමින් යාවත්කාලීන කළ යුතුය
    c. මුල් පර්යේෂකයා විසින් ඔහුගේ නමට ලබාගන්නා සියලුම මුදල් අතිකාරම් පියවීමට බැඳී සිටියි.
    d. යම් හෙයකින් නව පර්යේෂකවරයෙකු පත් නොකර රටින් බැහැරව සිට හෝ නිවාඩු මත පර්යේෂණය සිදුකිරීමට කැමැත්තේ නම් මුල් පර්යේෂකයා විසින් පර්යේෂණ කටයුතු සම්බන්ධව සන්නිවේදනය කිරීමට සම්බන්ධීකාරකවරයෙකු පත්කළ යුතුය .

7. පර්යේෂකවරයා විසින් ඉහත සඳහන් වගකීම් නොදරන්නේ නම් පර්යේෂණය සඳහා දැනට ලබාගෙන ඇති පර්යේෂණ ආධාර මුදල් ඔහුගේ ඇයගේ සේවක අර්ථසාධක අරමුදලෙන් අය කරගනු ලැබේ.

## 6. <u>අවසන් වාර්තාව සහ මූල්‍ය වාර්තා ලබාදීම.</u>

1. අවසන් වාර්තාව ලබාදීමට පෙර සියලුම මුදල් අතිකාරම් උපයෝජනයට පර්යේෂකවරයා බැඳී සිටී.

2. අංක 5 යටතේ විස්තර කර ඇති පරිදි යම් හෙයකින් පර්යේෂකවරයාට පර්යේෂණය සම්පූර්ණ කිරීමට නොහැකි වුවහොත් දැනට සිදුකර ඇති දෑ පිළිබඳ වාර්තාවක් සහ අයවැය වාර්තාවක් පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

3. පර්යේෂණ කාලය අවසන් වන දින සිට ඉදිරියට මාස තුනක් අවසන් වාර්තාව සැකසීමට හා මුදල් අත්තිකාරම් පියවීම සඳහා පර්යේෂකයාට ලබා දේ.

4. පර්යේෂණය පිළිබඳ අවසන් වාර්තාව හෝ පර්යේෂණය හා සම්බන්ධ ප්‍රකාශන තොරතුරු පර්යේෂණ ව්‍යාපෘතිය හා සම්බන්ධ අවසන් නිගමන ගැනීම පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව තීරණය කරයි. පර්යේෂකවරයා විසින් අවසන් වාර්තාව ඉදිරිපත් කරන විට සියලුම අත්තිකාරම් පියවිය යුතුය. මෙය අදාළ වන්නේ අවසන් වාර්තාව වෙනුවට සම්පූර්ණ ප්‍රකාශන තොරතුරු ඉදිරිපත් කරන පර්යේෂකයන් සඳහා ද අදාල වේ .

5. අවසන් වාර්තාව ලබාදීමෙන් පසු එහි යම් සංශෝධනයක් සිදුවන අවස්ථාවක හෝ පර්යේෂණ අරමුදල් පිළිබඳ ගැටලුවක් පැන නැගුණු විට,

    a. පර්යේෂකයා විදේශගත වී ඇත්නම් ඉහත 5.5 සඳහන් පරිදි නම් කරන ලද පර්යේෂකයා ඒ සම්බන්ධව කටයුතු කළ යුතුය.

    b. පර්යේෂකයා සේවයෙන් ඉවත් වී ඇති විට පර්යේෂණය නවතා දැමීම පිළිබඳව පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව තීරණය කරනු ලබන අතර පියවා නොමැති අත්තිකාරම් ඔහුගේ හෝ ඇයගේ අර්ථසාධක අරමුදලෙන් අයකර ගනු ලැබේ.